**නව ප්‍රවණතා**

# ගෝලීයකරණයට මානුෂික මුහුණුවරක්දීම

**පී. එම්. එන්. බණ්ඩාර විසිනි**

**ගෝලීයකරණය අලුත් දෙයක් නොවේ. එය ශතවර්ෂ ගණනාවකට කලින් ඇරඹුණු ක්‍රියාවලියකි. එහෙත් වර්තමාන ගෝලීයකරණ ක්‍රියාවලිය මෙරට පෙර ශත වර්ෂවල තත්ත්වයට වඩා විශේෂ ලක්ෂණ ගණනාවකින් යුක්ත ය.**

ගෝලීයකරණය යන සංකල්පය බිහිවූයේ දේශ සීමා අතර වෙළෙඳම සහ ප්‍රාග්ධන ප්‍රවාහයන් බාධාවකින් තොරව ගමන් කිරීමට මග පාදදීමේ ක්‍රියාවලියක් ලෙස ය. මෙම ක්‍රියාවලියේදී වෙළෙඳ බාධක, විනිමය හා නීතිමය බාධක ඉවත් කිරීමට ප්‍රධාන තැනක් හිමිවිය. එමෙන් ම මෙම ක්‍රියාවලිය සඳහා සන්නිවේදන තාක්ෂණය ප්‍රධාන මෙවලමක් වේ යැයි අපේක්ෂා කරන ලදි.

ගෝලීයකරණය ලෝකයේ සියලුම රටවලට වාසිදායක සියලු ආර්ථික ව්‍යාධීන් සුවකරන කෝකටත් තෛලයක් යැයි බොහෝ රටවල පැතිර ගිය මතය විය. එහෙත් දැන් එය මිථ්‍යාවක් බව පිළිගැනීමට කාලය එළඹී ඇති බවත් එයට මානුෂික මුහුණුවරක් දීමෙන් පමණක් අපේක්ෂිත අරමුණු ඉටුකරගත හැකි බවත් 1999 වර්ෂය වෙනුවෙන් නිකුත් වී ඇති එක්සත් ජාතීන්ගේ සංවර්ධන වාර්තාව පෙන්වා දෙයි.

ප්‍රාග්ධන ප්‍රවාහයන්ට නිදහසේ ගලායාමට ඉඩ සැලසීමේ අහිතකර ප්‍රතිවිපාක පිළිබඳව ගෝලීයකරණ සංකල්පයේ නිර්මාතෘවරුන්ට අවබෝධවූයේ නැගෙනහිර ආසියානු රටවල මූල්‍ය අර්බුදයත් සමඟ ය. විදේශීය ආයෝජකයින් තම ආයෝජන ක්ෂණිකව ඉවත් කරගැනීම ආසන්නතම හේතුව ලෙස සැලකෙන මෙම මූල්‍ය අර්බුදය නිසා 1998 - 2000 කාලය තුළ නිෂ්පාදන පාඩුව සහ ඒ හේතු කොටගෙන ලෝකයට ඇතිවන අහිතකර බලපෑම දළ වශයෙන් ඩොලර් ට්‍රිලියන 2 ක් වේයැයි ඇස්තමේන්තු කර ඇත.

ගෝලීයකරණය සියලු ආර්ථික ව්‍යාධීන්ට එකම පිළියම නොවන බව මෙරට ජනතාවට සම්මන්ත්‍රණ, දේශන හා ලිපි පළ කිරීම මගින් පෙන්වා දුන් ශ්‍රී ලාංකික ආර්ථික විද්‍යාඥයින් දෙදෙනා වන්නේ ආචාර්ය ගාමිණී කොරයා සහ ආචාර්ය ජේ. බී. කැලේගමයි.

ගෝලීයකරණය අලුත් දෙයක් නොවේ. එය ශතවර්ෂ ගණනාවකට කලින් ඇරඹුණු ක්‍රියාවලියකි. එහෙත් වර්තමාන ගෝලීයකරණ ක්‍රියාවලිය මෙරට පෙර ශත වර්ෂවල තත්ත්වයට වඩා විශේෂ ලක්ෂණ ගණනාවකින් යුක්ත ය.

1. අලුත් වෙළෙඳ පොළවල්

විදේශීය විනිමය වෙළෙඳ පොළවල් සහ ප්‍රාග්ධන වෙළෙඳ පොළවල් මගින් අද මුළු මහත් ලෝකයම එකිනෙකට සම්බන්ධ වී පවතී. පැය 24 පුරාම නොනිඳ ක්‍රියාත්මක වන මෙම වෙළෙඳ පොළවල දිනකට හුවමාරුවන මුදල්වල වටිනාකම ඩොලර් ට්‍රිලියන 1.5 කි.

2. නව වෙළෙඳ පොළවල්

ගෝලීය වෙළෙඳ පොළවල් හා පුද්ගලයන් අන්තර්ජාල සම්බන්ධතා, සෙලියුලර් දුරකථන හා ජනමාධ්‍ය පද්ධතිය මගින් සම්බන්ධ වී ඇත.

3. නව ක්‍රියාකාරීන්

ලෝක වෙළෙඳ සංවිධානය වැනි ආයතන, බහුජාතික සමාගම්, ජාතික ආණ්ඩුවලටත් වඩා බලවත් වී ඇත. රාජ්‍ය නොවන සංවිධාන දේශ සීමා බාධක මගහරවා ගෙන ලොව පුරා ව්‍යාප්ත වී ඇති තවත් බලවත් ක්‍රියාකාරීන් විශේෂයකි.

4. නව නීති

වෙළෙඳාම, සේවා, බුද්ධිමය දේපළ යන කටයුතු සම්බන්ධයෙන් බහුජාතික ගිවිසුම් ජාතික ප්‍රතිපත්ති අබිබවා ක්‍රියාත්මක වේ.

මෙවැනි තත්ත්වයන් හමුවේ ජාතික ආණ්ඩුවලට රටතුළ ඇතැම් කටයුතු පාලනය කර ගැනීමට නොහැකි ආකාරයට ගෝලීයකරණය ක්‍රියාත්මක වී ඇත.

අද ගෝලීයකරණය වෙළෙඳම හා මූල්‍ය ප්‍රවාහයන්ට පමණක් සීමාවී නැත. ගෝලීය හැකිලීයාම, කාලය හැකිලීයාම සහ දේශසීමා වලින් ප්‍රයෝජනයක් නොවීම වැනි හේතූන් නිසා පෙර කිසිදු නොවූ අන්දමින් එක් රටක කටයුතු තවත් රටක ජනතාවගේ ජීවිතවලට දැඩි බලපෑමක් කරයි. තායි බාට් මුදලේ බිඳ වැටීම බලපෑවේ තායිලන්ත වැසියන්ට පමණක් නොවේ. එය අග්නිදිග ආසියාවේ මිලියන ගණනකට රැකියා අහිමි වීමට බලපෑවේ ය. මේ අනුව ගෝලීයකරණ ක්‍රියාවලියේ ප්‍රතිඵලය වී ඇත්තේ රටවල් අතර අන්තර් රැඳියාව පෙර නොවූ විරූ ලෙස වර්ධනය වීමයි. එය ආර්ථික වශයෙන් ඒකාබද්ධවීමක් නොව සංස්කෘතිමය තාක්ෂණික සහ පාලනය අතින් ද ඒකාබද්ධ වීමකි.

ගෝලීයකරණය ලොව පුරා වෙසෙන මිලියන ගණනක් වන ජනතාවට වර්ධනය වූ වෙළෙඳාම, නව තාක්ෂණය, විදේශ ආයෝජන, පුළුල්වන ජනමාධ්‍ය, අන්තර්ජාල පහසුකම් මගින් ආර්ථික වර්ධනය ළඟාකර ගැනීමටත්, මිනිසාට ඉදිරියට යාමටත් අවස්ථා උදාකර දී ඇතැයි ද 21 වන සියවස තුළ දුගී භාවය තුරන් කිරීමට අවස්ථා උදාකර දී ඇතැයි ද ප්‍රකාශ වේ. එහෙත් ඒ වෙනුවට සිදුවෙමින් පවතින්නේ වෙනත් දෙයකි.

ගෝලීයකරණය නිසා වෙළෙඳ පොළ විවෘතවීම දේශීය වෙළෙඳ පොළ කෙරෙහිත්, රටේ ජනතාව කෙරෙහිත් බලපෑම් ඇති කර ඇත.

ඉහළ ආදායම් ලබන රටවල ජීවත්වන ලෝක ජනගහනයෙන් 1/5 ක් වන පිරිස විසින් ලෝකයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 86% ක් ද, ලෝක අපනයන වෙළෙඳපොළෙන් 82% ක් ද, සෘජු විදේශ ආයෝජන වලින් 68% ක්ද, ලෝක දුරකථන මාර්ග වලින් 74% ක්ද, අත්පත් කරගෙන ඇත. දුප්පත්කම රටවල් 1/5 විසින් එක් එක් අංශයෙන් අත්කරගෙන ඇත්තේ 1% ක් පමණි.

1998 දී එක් එක් අංශයේ වෙළෙඳ පොළ කොටසින් ඉහළම සමාගම් 10 විසින් හිමිකරගෙන ඇති ආකාරය මෙසේ ය. විදුලි සංදේශ 86%, පරිගණක 85%, පශු වෛද්‍ය 70%, ඖෂධ 35%, වාණිජ බීජ 32%, ලෝක ජනතාවගෙන් පොහොසත්ම 1/5 සහ දුප්පත්ම 1/5 අතර ආදායම් පරතරය ඒක පුද්ගල සාමාන්‍ය ජාතික ආදායම අනුව 1960 දී 30:1 ක් වූ අතර 1997 දී 74:1 ක් දක්වා වැඩිවී ඇත.

ටැන්සානියාවේ ණය සේවා ගෙවීම් ප්‍රාථමික සෞඛ්‍ය වියදම මෙන් නව ගුණයකි. ප්‍රාථමික අධ්‍යාපන වියදම මෙන් හතර ගුණයකි.

1977 දී සෘජු ආයෝජන ඩොලර් මිලියන 400 දක්වා වැඩිවී ඇතත් ඉන් 58% ගලා ගොස් ඇත්තේ කාර්මික රටවලට ය. 1980-96 කාලය තුළ රටවල් 32 ක් පමණක් අඛණ්ඩව 3% ක ආර්ථික වර්ධනයක් ළඟා කරගෙන ඇත. උපසහරා අප්‍රිකාව සහ නැගෙනහිර යුරෝපීය කලාපයේ රටවල් 59 ක ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය පහළ වැටී ඇත.

අනාවරණය වී ඇති තොරතුරු අනුව ගෝලීයකරණයේ බලවේගයන් විසින් ජාතික දේශසීමා හරහා ගලා යන භාණ්ඩ හා සේවා

අද ගෝලීයකරණය වෙළෙඳම හා මූල්‍ය ප්‍රවාහයන්ට පමණක් සීමාවී නැත. ගෝලීය හැකිලීයාම, කාලය හැකිලීයාම සහ දේශසීමා වලින් ප්‍රයෝජනයක් නොවීම වැනි හේතූන් නිසා පෙර කිසිදු නොවූ අන්දමින් එක් රටක කටයුතු තවත් රටක ජනතාවගේ ජීවිතවලට දැඩි බලපෑමක් කරයි.

ප්‍රවාහයේ වර්ධනය නිසා ද වාසි ලබන රටවලට පෙර නොවූ විරූ ධනස්කන්ධයක් රැස්කර ගැනීමට හැකි වී ඇත. මෙහි ප්‍රතිඵලය වූයේ දුප්පත් හා පොහොසත් රටවල් අතර පමණක් නොව රට තුළ පුද්ගලයන් අතර ද පරතරය වැඩිවීමයි. බොහෝ සාධක අනුව රටවල් 85 ක තත්ත්වය මීට දශක කිහිපයකට පෙර තත්ත්වයට වඩා බෙහෙවින් පහළ මට්ටමකට පත්වී ඇත.

නියත වශයෙන්ම ජාතික ධනය වන්නේ එහි වාසය කරන මිනිසුන් ය. සංවර්ධණයේ අරමුණ විය යුත්තේ මිනිසුන්ට හොඳ සෞඛ්‍ය තත්ත්වයක් යටතේ වැඩි කාලයක් පහසුවෙන් ජීවත්වීමට සුදුසු වාතාවරණයක් සකස් කිරීම බව ලෝක මානව සංවර්ධන වාර්තාව පෙන්වා දෙයි.

වෙළෙඳ පොළ කාර්යක්ෂමතාව සහතික කරන උපකරණයක් වන්නට පුළුවන. එහෙත් සාධාරණත්වය එමගින් සහතික කරන්නේ නැත. ඒ නිසා මානව සංවර්ධනයේ ඒකායන මාර්ගය වෙළෙඳ පොළ නොවේ. මානව සංවර්ධනය සඳහා බොහෝ ක්‍රියාකාරකම් භාණ්ඩ වෙළෙඳ පොළෙන් බාහිරව සම්පාදනය කිරීම අවශ්‍ය වේ. එහෙත් මේවා ලෝක තරගකාරී බලවේගයන් හමුවේ හැකිලී ගොස් ය. පොදු භාණ්ඩ සම්පාදනය අයවැය මගින් හකුළුවා ඇත. රැක බලා ගැනීමේ කටයුතු ආවේකය මගින් හකුළුවා ඇත.

වෙළෙඳ පොළ මත සියළු කටයුතු සිදුවීමට ඉඩ තැබුවහොත් බලය හා ධනය පුද්ගලයන් කිහිප දෙනෙකු අතට, ජාතීන් කිහිපයක් අතට පත්වනු ඇත. වෙළෙඳ පොළ පාලනය කර ගැනීමට නොහැකිවූ විට නැගෙනහිර ආසියානු රටවල සිදුවූවාක් මෙන් ආර්ථික අස්ථාවරත්වය ඇති වේ.

මෙම තත්ත්වයන් හමුවේ ගෝලීයකරණයේ කොපමණ වාසි තිබුණත් එම වාසි සියළු රටවල් අතරත්, පුද්ගල කණ්ඩායම් අතර බෙදහැරීම සඳහාත් මානව සංවර්ධනය ඇති කිරීම සඳහාත් ගෝලීයකරණ ක්‍රියාවලියට මානුෂික මුහුණුවරක් දිය යුතු බව නොබෝද නිකුත්වූ 1999 වර්ෂය සඳහා වූ මානව සංවර්ධන වාර්තාවේ සඳහන් කර ඇත. මෙහි ඉහතින් සඳහන් කළ සංඛ්‍යා හා තොරතුරු ද එම වාර්තාවෙන් උපුටාගත් ඒවා ය. වාර්තාව පෙන්වා දෙන අන්දමට ගතවෙමින් පවතින ශත වර්ෂයේ ලෝක වෙළඳම විවෘත කිරීම සඳහා ආචාර ධර්ම, ප්‍රතිපත්ති සහ ප්‍රමිතයන් පිහි විය. ඒවා ක්‍රියාත්මක කිරීමට ආයතන ද බිහි විය. එහෙත් මිනිසුන් සහ ඔවුන්ගේ අයිතිය තහවුරු කිරීම සඳහා ගත් පියවරයන් පිළිබඳව ප්‍රගතිය ප්‍රමාණවත් නැත. එළඹෙන සහස්‍රයේ ගෝලීයකරණ ක්‍රියාවලියට ඇති අභියෝගය වන්නේ එයයි.

මානව සංවර්ධන වාර්තාව ගෝලීයකරණයට මානුෂික මුහුණුවරක් දීම සඳහා නිර්දේශ 7 ක් ඉදිරිපත් කර ඇත. ඒවා පහත දැක්වේ.

1. මානව සංවර්ධනය සඳහා ඉවහල්වන ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සහ ඒවා ගෝලීය ආර්ථිකයේ නව යථාර්ථයන්ට ගැලපීම

2. මූල්‍ය කටයුතුවල සංවේදිතාව නිසා ඇතිවන තර්ජන අවම කිරීම සහ එමගින් ඇතිවන මානව පිරිවැය අවම කිරීම

3. මානව ආරක්ෂාව සඳහා පවතින ගෝලීය තර්ජන නවතාලීම සඳහා ගෝලීය මට්ටමෙන් ක්‍රියා කිරීම

4. මානව සංවර්ධනය සහ දුගීභාවය තුරන් කිරීම සඳහා තාක්ෂණය දියුණු කිරීම සඳහා පොදුවේ ක්‍රියා මාර්ග ගැනීම

5. දුප්පත් හා කුඩා රටවලට ගෝලීයකරණයෙන් සිදුවන අහිතකර තත්ත්වයන් නැති කිරීමට ක්‍රියා කිරීම

6. ගෝලීය පාලන ව්‍යුහයේ අසමතුලිතතාවයන් නැති කිරීමට පියවර ගැනීම

7. වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ගෝලීය පාලන ක්‍රමයක් ගොඩනැංවීම

❑

**(ආර්ථික විද්‍යාව පිළිබඳ පාඨ ග්‍රන්ථ ගණනාවක් ලියා ඇති මෙම ලේඛකයා ආර්ථික විද්‍යා අධ්‍යාපනික අර්ධ මාසික සංග්‍රහයේ ප්‍රධාන කර්තෘවරයා ය.)**

# බෝග වගාව - පලතුරු බෝග...

75 වැනි පිටුවෙන්

ග්‍රෑම් 300 – 350 ක් පමණ ය. එය ඉදෙන විට දම්පැහැයට හැරේ.

4. මෙක්සිකානු හා ගෝතමාලා කාණ්ඩ අතර දෙමුහුමකි. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 225 – 350 ක් පමණ ය. පිට පොත්ත තුනී වන අතර රළු ය. අඩංගු මේද ප්‍රමාණය 18% – 26% පමණ ය.

5. සිමන්ඩ්ස්

බටහිර ඉන්දියානු කාණ්ඩයට අයත් ප්‍රභේදයකි. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 450 කි. පිට පොත්ත සිනිඳු ය. දිළිසෙන සුළු ය. ගෙඩිය ඉදෙන විට කහ පැහැති කොළ පැහැයට හැරේ.

6. ටවර් II

ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 375 කි. ඉදුණු විට පිටපොත්තේ කොළ පැහැය වෙනස් නොවේ.

7. බූත් 7

ගෝතමාලා හා බටහිර ඉන්දියානු කාණ්ඩ අතර දෙමුහුමකි. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 275 – 375 ක් පමණ ය. ඉදෙන විට ද පිටපොත්ත කොළ පැහැති ය.

සිටුවීමට බීජ පැළ හෝ බද්ධ පැළ හෝ යොදා ගැනේ. බද්ධ පැළ නිපදවීමට අංකුර බද්ධය හා රිකිලි බද්ධය භාවිත කරයි. තවානේ බීජ සිටුවන මාධ්‍ය තෝරා ගැනීමේදී අනවශ්‍ය තෙතමනය රැඳ නොපවතින ලෙස වග බලා ගත යුතු ය. මීට ගංගා වැලි සුදුසු ය.

ගංගා වැලි හා කොහුබත් 4:1 හෝ ගංගා වැලි හා ලී කුඩු 2:1 සිට 4:1 දක්වා මිශ්‍ර කිරීමෙන් හෝ ලී කුඩු පමණක් යෙදීමෙන් මාධ්‍ය සකසා ගැනේ.

තවාන් පාත්තියේ බීජ නිසි පරතරයක් සහිතව සිටුවීම වැදගත් ය. පේළි දෙකක් අතර පරතරය සෙන්ටිමීටර 20 ක් ද පේළිය තුළ බීජ අතර පරතරය සෙන්ටි මීටර 2–3 පමණ ද තිබිය යුතු ය. බීජ සිටුවීමෙන් පසු තවානේ තෙතමනය නිසි පරිදි පවත්වාගත යා යුතු ය.

වර්ෂා කාලය ආරම්භයේ දී පැළ සිටුවීම වැදගත්. පැළය සෘජුව වර්ධනය වීමට සැළැස්වීම සඳහා ඒ අසල ආධාරකයක් සිටුවා පැළය එයට තබා ගැට ගැසිය යුතු ය. සෙන්ටිමීටර 60x60x60 ප්‍රමාණයේ වලවල් තුළ පැළ සිටුවිය යුතු ය. පැළ සිටුවීමට සති දෙකකට පෙර මතුපිට පස් හා කොම්පෝස්ට් පොහොර හොඳින් මිශ්‍රකර එම වලවල්වලට පිරවීමට මතක තබාගත යුතු ය. පැළ අවට පස වියළීම වලක්වා ගැනීමටත්, වල් පැළෑටි පාලනයටත් වියළි තණකොළ හෝ පිදුරු වැනි ද්‍රව්‍ය වසුන් ලෙස යෙදිය යුතු ය.

එළ නොදරන එක් ගසක් සඳහා පැළ සිටුවීමට දින 2 කට පෙර ග්‍රෑම් 115 ක් යූරියා ද, ග්‍රෑම් 230 ක් රොක් පොස්පේට් ද, ග්‍රෑම් 105 ක් මියුරියේට් ඔෆ් පොටෑෂ් ද මාස 6 කට පසු, මාස 12 කට පසු හා වසරක් පාසා ග්‍රෑම් 60 ක් යූරියා ද, ග්‍රෑම් 115 ක් රොක්පොස්පේට් ද, ග්‍රෑම් 55 ක් මියුරියේට් ඔෆ් පොටෑෂ් ද යෙදීම වැදගත්. ග්‍රෑම් 355 ක් යූරියා ද, ග්‍රෑම් 680 ක් රොක් පොස්පේට් ද, ග්‍රෑම් 320 ක් මියුරියේට් ඔෆ් පොටෑෂ් ද වසරක දී උපරිම වශයෙන් යෙදිය යුතු ය. එළ දරන ගසක් සඳහා ග්‍රෑම් 705 ක් යූරියා ද, ග්‍රෑම් 1360 ක් රොක් පොස්පේට් ද, ග්‍රෑම් 635 ක් මියුරියේට් ඔෆ් පොටෑෂ් ද වසරකට උපරිම ලෙස යෙදිය යුතු ය. නියමිත අස්වැන්නක් ලබා ගැනීම සඳහා වගාවට ජල හිඟයක් ඇති නොවීමට වගබලා ගැනීම වැදගත්.

පලතුරු මැසි විශේෂ කුරුමිණි හානිය, මුල් කුණු වීම, ඇන්ත්‍රැක්නෝස් රෝගය, ගෙඩි කුණු වීමට වගාව ගොදුරු වේ. අලිගැටපේර වගා කිරීමේ දී පැළ හා පේළි අතර අතුරු වගාවක් ලෙස කෙසෙල් වගා කළ හැකි ය.

ගෙඩිය නෙලා ගැනීමට ගතවන කාලය ද ප්‍රභේද අනුව වෙනස් වේ. නියමිත ප්‍රමාණයට මේරූ ගෙඩි නෙලා සතියක දී ඉදීමට පටන් ගනියි.

❑

සටහන :–

**සමන්ත මල්ලවආරච්චි**

**තිළිණ රුවන් මලලසේකර**